ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක : 2477424, 2477423, 2477418
ෆැක්ස් : 2346257, 2477739
ඊ-මේල් : dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය : www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| නිකුත් කළේ | ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව |
|---|---|
| දිනය | 07.07.2020 |

## ශ්‍රී ලංකා මහ බැංකුව බ්ලොක්චේන් තාක්‍ෂණය පදනම් ගත් ගනුදෙනුකරුවන් හඳුනාගැනීම සඳහා වූ සංකල්ප සාධන ක්‍රියාවලිය ආරම්භ කරයි

2020 ජුලි 07 වන දින ශ්‍රී ලංකා මහ බැංකුව බ්ලොක්චේන් තාක්‍ෂණය (Blockchain Technology) පදනම් කරගත් ගනුදෙනුකරු හඳුනාගැනීමේ (Know-Your-Customer- KYC) ක්‍රියාවලිය ආරම්භ කිරීම සඳහා ගිවිසුම් අත්සන් කරන ලදි. ශ්‍රී ලංකා මහ බැංකුව 2018 වර්ෂයේදී බ්ලොක්චේන් තාක්‍ෂණයෙන් මූල්‍ය කටයුතු සඳහා ලබා ගත හැකි ප්‍රතිලාභ හඳුනාගන්නා ලද අතර, බැංකු සහ තොරතුරු තාක්‍ෂණ ක්‍ෂේත්‍රයන්හි ස්වේච්ඡා සහභාගීත්වයෙන් බ්ලොක්චේන් තාක්‍ෂණය පිළිබඳ අන්තර්-ක්‍ෂේත්‍ර අධ්‍යනයක් ආරම්භකරන ලදි. ශ්‍රී ලංකාවේ බ්ලොක්චේන් තාක්‍ෂණය පදනම් කරගත් මූල්‍ය සේවා වලට මග පෑදීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව මෙලෙස ගනුදෙනුකරු හඳුනා ගැනීමට පහසු ක්‍රියාවලියක් සකස් කිරීමට තීරණය කරනු ලැබීය. ඒ අනුව, ශ්‍රී ලංකා මහ බැංකුව බ්ලොක්චේන් තාක්‍ෂණය පදනම් කර ගත් සේවාවන් වලට මගපෑදීම සඳහා ගනුදෙනුකරු හඳුනාගැනීමේ ඩිජිටල් ක්‍රමවේදයන් සකස් කිරීම පිළිබඳ අත්දැකීම් ඇති සමාගම් වලට මෙම ව්‍යාපෘතිය සඳහා ස්වෙච්ඡා පදනමක් මත සම්බන්ධ වන ලෙස ආරාධනය කරමින් දැන්වීම් පළ කරනු ලැබිණි. මෙලෙස ලැබුණු අයදුම්පත් රාශියක් අතරින්, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සමගාමීව සංකල්ප සාධනයන් (Proof of Concept-POC) නිර්මාණය කිරීම සඳහා අයදුම්කරුවන් තිදෙනෙකු තෝරා ගන්නා ලදි.

සංකල්ප සාධනය නිර්මාණය සඳහා විදේශීය ආයතන 17ක් ඇතුළුව ආයතන 40ට අධික සංඛ්‍යාවක් තනි තනිව සහ ඒකාබද්ධ වශයෙන් අයදුම් කරන ලදි. තේරීම් වට කිහිපයකට පසුව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ශ්‍රී ලංකාවේ මෙම පුරෝගාමී ව්‍යාපෘතිය සඳහා අයදුම්කරුවන් තිදෙනෙකු තෝරා ගන්නා ලදි. ඒ අතරින් සම්පත් බැංකුව සහ කොළඹ විශ්වවිද්‍යාලයේ පරිගණක අධ්‍යාපන ආයතනය (UCSC) ඒකාබද්ධ අයදුම්කරුවන් ලෙස, ස්වීඩනයේ නෝර්බ්ලොක් ඒබී (Norbloc AB) සහ ශ්‍රී ලංකික සමාගම් දෙකක් වන යාල ලැබ්ස් (Yaala Labs) පෞද්ගලික සමාගම සහ ලිනියර්සික්ස් (LinearSix) පෞද්ගලික සමාගම ඒකාබද්ධ අයදුම්කරුවන් ලෙස තෝරා ගන්නා ලදි.

තෝරාගත් අයදුම්කරුවන් සහ ශ්‍රී ලංකා මහ බැංකුව අතර ගිවිසුම් අත්සන් කිරීම ශ්‍රී ලංකා මහබැංකු අධිපති දේශමාන්‍ය මාහාචාර්ය ඩබ්ලිව්.ඩී. ලක්ෂ්මන් මහතා ඉදිරිපිට දී ජ්‍යෙෂ්ඨ බැංකු නිලධාරීගේ සහභාගීත්වයෙන් සිදු කරන ලදි.

මෙම අවස්ථාවේදී මහ බැංකුව අධිපතිතුමා සිය අදහස් දැක්වීමේදී අපගේ ජීවිතේ සෑම අංශයක්ම ඩිජිටල්කරණය වෙමින් පවතින ලෝකයක අප ජීවත් වන බැවින්, ශ්‍රී ලංකාවේ ඩිජිටල් මුල්‍ය යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම සඳහා මහ බැංකුව විශාල උත්සහයක් ගෙන ඇති බව, ගණුදෙනුකරු හඳුනා ගැනීමේ තොරතුරු සුරක්ෂිතව බෙදා ගැනීම සඳහා බ්ලොක්චේන් වැනි තාක්ෂණයක් භාවිතා කිරීමේ ශක්‍යතාව තක්සේරු කිරීම හා එය මගින් ශ්‍රී ලාංකිකයින්ගේ ඩිජිටල් මුල්‍ය අන්තර්ගතභාවය බෙහෙවින් වර්ධනය කිරීමේ හැකියාව ඇති බව සහ ගනුදෙනුකරු හඳුනාගැනීමේ තොරතුරු මුල්‍ය ආයතන අතර බෙදාගැනීමේ පහසුකම මගින් ඩිජිටල් සහ දුරස්ථ ලෙස ගනුදෙනුකරුවන් මුල්‍ය සේවාවලට බඳවා ගැනීමේ ප්‍රවේශ වැඩිකර ගැනීමට අවස්ථා උදා වන බව ප්‍රකාශ කරන ලදි.

ජාතික ගෙවීම් කවුන්සිලයේ සභාපති ශ්‍රී ලංකා මහ බැංකුවේ නියෝජ්‍ය අධිපති එච්. ඒ. කරුණාරත්න මහතා ලොවපුරා සමාගම් මෙම ජාතික ව්‍යාපෘතියට සම්බන්ධ වීමට දක්වන ලද උනන්දුව හේතුවෙන්, තෝරාගැනීමේ ක්‍රියාවලිය අතිශය තරඟකාරී වු බව ප්‍රකාශ කරන ලදි. තවද, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මෙහෙයවනු ලබන අන්තර්- ක්ෂේත්‍ර ඩිජිටල් නවෝත්පාදනයන් දියුණු කිරීම දේශීයව මෙන්ම අන්තර්ජාතික වශයෙන් ද කුසලතා දියුණු කිරීමට ආධාර වන බවද අවධාරණය කරන ලදි.

සහකාර අධිපති ආර්. ඒ. ඒ. ජයලත් මහතා මෙම සංකල්ප සාධනයෙහි සොයාගනීම්වල ප්‍රතිලාභ ශ්‍රී ලංකාවට පමණක් නොව, ගෝලීය වශයෙන් මූල්‍ය සේවා සඳහා බ්ලොක්චේන් තාක්ෂණය යොදා ගැනීම පිළිබඳ අවබෝධය වැඩි දියුණු කිරීමට ද ඉවහල් වන බව අවධාරණය කලේය.

ගෙවීම් සහ පියවීම් අධ්‍යක්ෂ ඩී. කුමාරතුංග මහතා සඳහන් කළේ ශ්‍රී ලංකාවට ඩිජිටල් ගනුදෙනු වලින් ලැබෙන ඉමහත් ප්‍රතිලාභ හේතුවෙන් ඩිජිටල් ගනුදෙනු ප්‍රවර්ධනය කිරීම සඳහා ගමනක් ආරම්භ කර ඇති බවයි. බ්ලොක්චේන් තාක්ෂණය පිළිබඳ හවුල් ගනුදෙනුකරුවන් හඳුනාගැනීමේ පහසුකම සඳහා සංකල්ප සාධන පහසුකමක් තිබීම නිසැකවම රටේ මූල්‍ය සේවා වැඩි දියුණු කිරීමට උපකාරී වනු ඇතැයි ඔහු ඔහු අවධාරණය කළේය.




ඉදිරි පෙළ වමේ සිට දකුණට:සම්පත් බැංකුවේ කළමණාකාර අධ්‍යක්ෂක නන්ද ප්‍රනාන්දු මහතා, ශ්‍රී ලංකා මහ බැංකුවේ සහකාර අධිපති ආර්.ඒ.ඒ. ජයලත් මහතා, කොළඹ විශ්වවිද්‍යාලයේ පරිගණක අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ මහාචාර්ය කේ.පී. හේවාගමගේ මහතා

පසු පෙළ වමේ සිට දකුණට :ශ්‍රී ලංකා මහ බැංකුවේ ගෙවීම් සහ පියවීම් අධ්‍යක්ෂ ඩී. කුමාරතුංග මහතා, ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති දේශමාන්‍ය මාහාචාර්ය ඩබ්ලිව්.ඩී. ලක්ෂ්මන් මහතා, ශ්‍රී ලංකා මහ බැංකුවේ නියෝජ්‍ය අධිපති එච්. ඒ. කරුණාරත්න මහතා




ඉදිරි පෙළ වමේ සිට දකුණට : යාල ලැබ්ස් පුද්ගලික සමාගමේ ප්‍රධාන විධායක නිළධාරී ලලින් ඩයස් මහතා, ශ්‍රී ලංකා මහ බැංකුවේ සහකාර අධිපති ආර්.ඒ.ඒ. ජයලත් මහතා, ලීනියර්සික්ස් පුද්ගලික සමාගමේ ප්‍රධාන විධායක නිළධාරී මාරියෝ ගුනරත්න මහතා,

පසු පෙළ වමේ සිට දකුණට : ශ්‍රී ලංකා මහ බැංකුවේ ගෙවීම් සහ පියවීම් අධ්‍යක්ෂ ඩී. කුමාරතුංග මහතා, ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති දේශමාන්‍ය මාහාචාර්ය ඩබ්ලිව්.ඩී. ලක්ෂ්මන් මහතා, ශ්‍රී ලංකා මහ බැංකුවේ නියෝජ්‍ය අධිපති එච්. ඒ. කරුණාරත්න මහතා



ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති දේශමාන්‍ය මාහාචාර්ය ඩබ්ලිව්.ඩී. ලක්ෂ්මන් මහතා සම්පත් බැංකුවේ කළමණාකාර අධ්‍යක්ෂක නන්ද ප්‍රනාන්දු මහතා සහ කොළඹ විශ්වවිද්‍යාලයේ පරිගණක අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ මහාචාර්ය කේ.පී. හේවාගමගේ මහතා සමග ගිවිසුම හුවමාරුකර ගනිමින්

වමේ සිට දකුණට : ශ්‍රී ලංකා මහ බැංකුවේ ගෙවීම් සහ පියවීමේ ජ්‍යෙෂ්ඨ සහකාර අධ්‍යක්ෂ කේ. අඹගහවිට මහත්මිය, කොළඹ විශ්වවිද්‍යාලයේ පරිගණක අධ්‍යාපන ආයතනයේ ආචාර්ය කසුන් පෙරේරා මහතා හා අධ්‍යක්ෂ මහාචාර්ය කේ.පී. හේවාගමගේ මහතා සම්පත් බැංකුවේ සමූහ ප්‍රධාන තොරතුරු නිළධාරී අජිත් සල්ගාදු මහතා, ශ්‍රී ලංකා මහ බැංකුවේ නියෝජ්‍ය අධිපති එච්. ඒ. කරුණාරත්න මහතා,, ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති දේශමාන්‍ය මාහාචාර්ය ඩබ්ලිව්.ඩී. ලක්ෂ්මන් මහතා, සම්පත් බැංකුවේ කළමණාකාර අධ්‍යක්ෂක නන්ද ප්‍රනාන්දු මහතා, ශ්‍රී ලංකා මහ බැංකුවේ සහකාර අධිපති ආර්.ඒ.ඒ. ජයලත් මහතා, ශ්‍රී ලංකා මහ බැංකුවේ ගෙවීම් සහ පියවීම් අධ්‍යක්ෂ ඩී. කුමාරතුංග මහතා, සම්පත් බැංකුවේ ජ්‍යෙෂ්ඨ කළමණාකාර නුවන් වික්‍රමනායක මහතා, සම්පත් බැංකුවේ සහකාර සාමාන්‍යාධිකාරී පසන් මනුකිත් මහතා.



ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති දේශමාන්‍ය මාහාචාර්ය ඩබ්ලිව්.ඩී. ලක්ෂ්මන් මහතා යාල ලැබ්ස් පුද්ගලික සමාගමේ ප්‍රධාන විධායක නිළධාරී ලලින් ඩයස් මහතා ලීනියර්සික්ස් පුද්ගලික සමාගමේ ප්‍රධාන විධායක නිළධාරී මාරියෝ ගුනරත්න මහතා සමග ගිවිසුම හුවමාරුකර ගනිමින්

වමේ සිට දකුණට :යාල ලැබ්ස් පුද්ගලික සමාගමේ තරිඳු දිසානායක මහතා, ලීනියර්සික්ස් පුද්ගලික සමාගමේ ඉෂාන් විජේතුංග සහ ප්‍රධාන විධායක නිළධාරී මාරියෝ ගුනරත්න මහතා, ශ්‍රී ලංකා මහ බැංකුවේ නියෝජ්‍ය අධිපති එච්. ඒ. කරුණාරත්න මහතා, යාල ලැබ්ස් පුද්ගලික සමාගමේ ප්‍රධාන විධායක නිළධාරී ලලින් ඩයස් මහතා, ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති දේශමාන්‍ය මාහාචාර්ය ඩබ්ලිව්.ඩී. ලක්ෂ්මන් මහතා, ශ්‍රී ලංකා මහ බැංකුවේ සහකාර අධිපති ආර්.ඒ.ඒ. ජයලත් මහතා, ශ්‍රී ලංකා මහ බැංකුවේ ගෙවීම් සහ පියවීම් අධ්‍යක්‍ෂ ඩී. කුමාරතුංග මහතා, ශ්‍රී ලංකා මහ බැංකුවේ ගෙවීම් සහ පියවීමේ ජ්‍යෙෂ්ඨ සහකාර අධ්‍යක්‍ෂ කේ. අඹගහවිට මහත්මිය